# පරිසරය සහ සංවර්ධනය

# රියෝ සමුළුව ඉදිරියේ ඇති ප්‍රශ්න

ආචාර්ය ගාමණී කොරයා

LIBRARY
Ministry of Environment &
Natural Resources

## සමුළුව

පරිසරය සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය මේ අවුරුද්දේ ජූනි මාසයේ දී බ්‍රසීලයේ රියෝ ද ජැනෙයිරෝ හිදී රැස් වනවා ඇත. එය සුවිශේෂ වැදගත්කමකින් යුත් සම්මේලනයක් වනු ඇත. එනම් – එක්සත් ජාතීන්ගේ ඉතිහාසයෙහි පළමු වරට රාජ්‍ය නායක මට්ටමකින් රැස්වන්නක් වනු ඇත. දනටමත් මේ සමුළුව විසින් පෙර නො වූ විරූ අන්දමේ උනන්දුවක් සහ බලාපොරොත්තු කුළුගන්වනු ලැබ ඇත. මෙහි ප්‍රස්තුත කාරණය, පෘථිවි ග්‍රහයාගේ ආරක්ෂාවත් මනුෂ්‍ය වර්ගයාගේ පැවැත්මටත් යම් ලෙසකින් අදාළ වන අතර එහි ප්‍රතිඵලයේ සාර්ථකත්වය කෙරෙහි අත්‍යවශ්‍ය වූ කාර්යයක් සියලු රටවලට සහ සියලු මිනිසුනට ඉටු කිරීමට තිබේ. ආණ්ඩුවල සහ සමුළු ලේකම් කාර්යාලයේ නියෝජිතයන්ගේ පමණක් නොව, රාජ්‍ය නො වන සංවිධානවල ද විද්‍යාඥයන්ගේ ද විද්වතුන්ගේ සහ විවිධ මාධ්‍ය අංශවල ද අවධානය යොමු කෙරෙන පුළුල් පූර්ව ක්‍රියාවලියක් සමුළුව උදෙසා දනටමත් සැකසෙමින් පවතී.

සංවර්ධන වෙමින් පවත්නා රටවල් සමුළුව සඳහා හොඳින් සූදනම් ව සිටීමත් එහි ලා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කිරීමත් අතිශයින් වැදගත් වේ. සමුළුවේදී තමන් සපුරා ගැනීමට අදහස් කරන අභිප්‍රායයන් ද එකී අභිප්‍රායයන්ට අනුකූල ව තමන් සිදු කිරීමට සූදනම් වන ක්‍රියා ද ඔවුන් විසින් විස්තර කර දෙනු ලැබිය යුතු ය. නිසැකව ම, පාරිසරික ප්‍රශ්නවලින් වැඩිම ප්‍රමාණයක් සමුළුවේ අවධානයට ලක් කෙරෙනු ඇත. එහෙත් ප්‍රධාන වශයෙන් එහි සැලකිල්ල යොමු කෙරෙන්නේ ප්‍රදේශබද්ධ ගැටළු කෙරෙහි සහ ජාතික තත්ත්වයන් කෙරෙහි යයි සිතිය නො හැකි ය. සැබැවින් ම, අවධාරණය ඇති කෙරෙනු ඇත්තේ වඩාත් පුළුල් කරුණු කෙරෙහි සහ දේශීය මායිම්වලින් ඔබ්බට බලපෑම් ඇති කරන කටයුතු ද කෙරෙහි ය. එ බැවින්, පරිසර ගැටළුවේ ගෝලීය විශාලත්වය කෙරෙහි සැලකිල්ල යොමු කිරීමටත් සංවර්ධනය වන රටවල් වශයෙන් මෙන් ම සෙසු ලෝකයත් සමග පොදුවේත් මේ විශාලත්වය තුළ තමන් සතු අවදනම හඳුනා ගැනීමටත් සංවර්ධන වන රටවල් සූදනම් විය යුතු ය.

## සමුළුවේ තේමාව

සමුළුවේ තේමාව පරිසර ය සහ සංවර්ධනය බැව් කල්පනාවට ගත යුතු ය. මෙකී තේමාව, ඇතැම් විට එකිනෙකට වෙනස් හේතූන් මත වුව ද, සංවර්ධනය වන රටවලට මෙන් ම සංවර්ධිත රටවලට ද වැදගත් වේ. සංවර්ධනය වන රටවල් හෝ වේවා සංවර්ධිත රටවල් හෝ වේවා සියලුම රටවලට දේශීය මෙන් ම ගෝලීය පරිසරය ද ආරක්ෂා කර ගැනීමේ දැඩි වගකීමක් ඇත. එනෙකුදු වුවත්, දේශීය වශයෙන් හෝ ගෝලීය වශයෙන් හෝ පරිසරය ආරක්ෂා කරනු සඳහා සිය සංවර්ධන ක්‍රියාවලිය අතහැර දැමීමේ විකල්පයක් සංවර්ධනය වන රටවලට නැති බැවින් ඔවුන්ට පරිසරයත් සංවර්ධනයත් අතර සම්බන්ධතාව තීරණාත්මක එකක් වේ. මේ රටවලට සංවර්ධනයත් පරිසර ආරක්ෂාවත් යන දෙක ම අනිවාර්ය දෙයක් වන අතර ප්‍රශ්නයේ වැදගත් ම අංශය වනුයේ පාරිසරික වශයෙන් යහපත් වූ ද ඒ අතර ම, වඩා හොඳ ජීවන තත්ත්වයක් සහ සේවා නියුක්තියක් සඳහා සිය ජනතාවන්ගේ ඉල්ලුම සපුරා ලීමට තරම් ශීඝ්‍ර වූ ද සංවර්ධන ක්‍රියාවලියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයි.

ජාතික මෙන් ම ගෝලීය පරිසරයට ද බොහෝ කොට තමන්ගේ ම කටයුතු නිසා සිදුව ඇති පාරිසරික

හානිය හරිගැස්සීම සහ වළක්වා ලීම ද සම්බන්ධයෙන් තීරණාත්මක උනන්දුවක් ඔවුන් පිළිබඳ සලකන විට සංවර්ධිත රටවලට ඇත. එහෙත් මේ රටවල් සඳහා ඇති මෙකී සංවර්ධන පාලනය ශක්තිමත් නැත. ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් එකක් වන අතර සාපේක්ෂක වශයෙන් ඔවුනගේ ජනගහනයේ විශාලත්වය ද ස්ථාවර ය. පරිසරයත් සංවර්ධනයත් අතර සම්බන්ධතාව පිළිබඳ ඔවුන්ට ද කළ යුතු කාර්යයක් ඇත. එහෙත්, එය බෙහෙවින් ම රඳා පවත්නේ තුන් වැනි ලෝකයේ සංවර්ධන ක්‍රියාවලිය ආරම්භ වී පරිභෝජන මට්ටම සහ සම්පත් පාවිච්චිය ඉහළ යන විට ගෝලීය පරිසර ගැටළු භයානක ලෙසත් නැවත හරිගස්වා ලිය නො හැකි ලෙසත් උග්‍ර විය හැකිය යන ප්‍රවේදිතාව මත ය. සංවර්ධිත රටවලට, පරිසරයත් සංවර්ධනයත් අතර සබඳතාව ලෝකය සමග සාකච්ඡා කොට අදහස් හුවමාරු කර ගත යුතු වැදගත් කරුණක් ලෙස පෙනෙන්නේ බෙහෙවින් ම මේ හේතුව නිසා ය.

## සමුළු ප්‍රශ්න

ඇත්ත වශයෙන් ම, පාරිසරික ගැටළු සියල්ල රියෝ ද ජැනෙයිරෝ හිදී සාකච්ඡාව සඳහා ඉදිරිපත් වනු ඇත. ගෝලීය රත්වීම, ඕසෝන් ස්තරය, විෂ අපද්‍රව්‍ය අපහරණය, ජෛව විවිධත්වය නැති ව යාම, භූමි සහ ජල සම්පත් හායනය යන මේ සියල්ල සහ වෙනත් පාරිසරික ප්‍රශ්න රාශියක් සඳහා විශෝධණීය හා නිවාරණ ක්‍රියා අර්ථවත් ලෙස කිරීම අවශ්‍ය ය. සංවර්ධනය වූ රටවලටත් සංවර්ධනය වන රටවලටත් මෙ බඳු ක්‍රියා කාරිත්වයක් සඳහා පොදුවේ උනන්දු වීමට කරුණු ඇත. ලෝක ජනගහනයෙන් සියයට 20 ක ජනගහනයක පමණක් වෙසෙන අතර ලෝක සම්පත් ප්‍රමාණයෙන් සියයට 80 ක් ප්‍රයෝජනයට ගන්නා (ඇතැම් විටෙක "අධිපරිභෝජක රටවල් " වශයෙන් විස්තර කෙරෙන) සංවර්ධිත රටවල්, ලෝකයේ පාරිසරික ගැටළු අතරින් වැඩි ප්‍රමාණයකට බොහෝ සෙයින් ම වග කිව යුතු වන බැවින් විශෝධණීය ක්‍රියා පිළිබඳ ව විශාල පරිශ්‍රමයක් දැරීමේ වගකීම ඔවුන් වෙත පැවරේ.

එ නමුත්, පරිසරය පිළිබඳ හැටළු සමග සටනක යෙදීමට සංවර්ධිත රටවලට ද සිදු වේ. විශේෂයෙන් ම ශීඝ්‍ර ජනගහන වර්ධනයක් සහිත වටපිටාවක් තුළ මිනිසුන්, හැටියට අධික වශයෙන් භාවිතයට ගැනීමෙන් හායනයට පත් කිරීමටත්, දර සඳහා කැලෑ කැපීමටත් නගරයට සංක්‍රමණය වීම මගින් නගර දුෂ්කරත්වයට පත් කිරීමටත් පෙළෙඹෙන්නේ දුප්පත් කම නිසා බැවින් ඉහත කී ගැටළුවලින් කොටසකට හේතුව හුදෙක් දුප්පත් කමම ය. මෙකී ගැටළුවලින් යම් ප්‍රමාණයක් තුනී කරලීමට නිශ්චිත ක්‍රියාමාර්ග සහ පිවිසුම් සමත් විය හැකි අතර දුප්පත්කම සහ එහි පාරිසරික ප්‍රතිවිපාක ජය ගත හැක්කේ වඩා පුළුල් සංවර්ධන ක්‍රියා දාමයක් තුළින් පමණි. කාර්මික රටවල අත්දැකීම් තුළින් පෙනී ගොස් ඇති පරිදි, සංවර්ධන ක්‍රියාවලිය ම සමුච්චිත පාරිසරික හායනයට මුඛ්‍ය හේතුව විය හැකි ය. එ බැවින්, සංවර්ධනය වන රටවලට පෙරමුණු දෙකක ක්‍රියා කිරීමට සිදු වේ. එනම් – දුප්පත් කම සහ එහි හානිකර පල-විපාක මැඩ ලීම සඳහා සංවර්ධන ක්‍රියාවලියක් නැංවීම සහ ඒ සමගා ම එකී සංවර්ධන ක්‍රියාවලිය පාරිසරික වශයෙන් යහපත් සහ ප්‍රවර්තනීය එකක් බවට සහතික වීම ද යනුවෙනි.

## සංවර්ධනය වන රටවල උපාය මාර්ගික අපේක්ෂා

එ බැවින්, මෙකී කරුණු අනුව සලකා බැලීමේ දී, සංවර්ධනය වන රටවලට රියෝ සමුළුව සඳහා යම් යම් මූලික උපායමාර්ගික අභිමතාර්ථ තිබිය යුතු ය.

## 1. පාරිසරික ඉඩ-කඩ

සංවර්ධිත රටවල – අතීත, වර්තමාන සහ අනාගත – ක්‍රියාවන්ගෙන් ගෝලීය පරිසරය කෙරෙහි ඇති වන බලපෑම කරණ කොට ගෙන තම අනාගත සංවර්ධනය පිළිබඳ විෂය පථය බිඳ නො වැටෙනු, ඇති බවට ඔවුන් පළමු කොට සහතික විය යුතු ය. සංවර්ධනය වන රටවලට "පාරිසරික ඉඩ-කඩ " තිබිය යුතු අතර සංවර්ධිත රටවල කටයුතු සහ ජීව රටාවන් විසින් මෙකී ඉඩකඩ දැනටමත් අල්ලා ගනු ලැබ තිබේ නම් සිය අනාගත සංවර්ධන අපේක්ෂා දැඩි ලෙස සීමා වනු ඇත. වර්තමානයේ වුවමනාවන්, අනාගතයේ වුවමනාවන් හා එකඟතාවයකින් තොර ව ඉටු කර ගත යුතුය යන්නක් "ප්‍රවර්තණීය සංවර්ධනය" නමැති සංකල්පයෙන් අදහස් නො කෙරේ. එ මෙන් ම, සංවර්ධිත රටවල අවශ්‍යතාවන්, සංවර්ධනය වන රටවල අවශ්‍යතාවන්ට නො ගැළපෙන මාර්ගවලින් මුදුන්පත් කර ගත යුතු බවක් ද ඉන් අදහස් නො කෙරේ. මෙ පරිද්දෙන්, නිදසුන් වශයෙන් දක්වතොත්, ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ ද ඕසෝන් ස්තරයට හානි පැමිණීමෙන් ද සමුද්‍ර දූෂණයේ ද හේතු වළක්වාලීමත් නිවැරදි කිරීමත් සඳහා සංවර්ධිත රටවල් විසින් ම ගනු ලැබිය යුතු ක්‍රියා මාර්ග, පරිසරයත් සංවර්ධනයත් අතර පවත්නා සම්බන්ධතාවට කේන්ද්‍රීය වේ. එතෙකුදු වුවත්, පාරිසරික වශයෙන් උපද්‍රවකාරී නො වන තාක්ෂණයන් හඳුන්වා දීම කෙරෙහි පමණක් ඒවා යොමු වෙතොත් ඒවා ප්‍රමාණවත් යයි කිව නො හැකි ය. සංවර්ධිත රටවල ගෝලීය පරිසර පද්ධතියට දැනට පැමිණෙන අවහිරතා අඩු වන අන්දමේ ජීවන ශෛලීන් සහ පරිභෝජන රටාවන්

සංවර්ධිත රටවල් තුළ හැකි සියලු ආකාරයෙන් ඇති කිරීමට මේවාට ඇතුළත් විය යුතු ය.

සංවර්ධිත රටවල ක්‍රියාමාර්ගී පිළිබඳ මේ ප්‍රශ්නය තවත් හේතුවක් නිසා ද වැදගත් වේ. කාර්මිකෘත රටවල ඉකුත් සංවර්ධන ආදර්ශය විශාල පරිමාණයෙන් ප්‍රතිජණනය කිරීමට ගෝලීය පරිසරය, සංවර්ධනය වන රටවලට ඉඩ නො දෙනු ඇතැයි යන්න සමහර විට සැබැවි. එහෙත්, සංවර්ධනය වන රටවල් විසින් අනුගමනය කෙරෙන යම් නව මගක්, වේද එය, සංවර්ධිත සහ සංවර්ධනය වන රටවල් අතර ජීවන තත්ත්වයන්හි අසමානකම් චිරස්ථායී කරමින් ජීවන ශෛලීන් දෙකකින් යුත් එක ලොවක් කරා යොමු කරන්නක් නො විය යුතු ය. සංවර්ධිත රටවල දනට ඇති රටාවන් හා ශෛලීන් නො කඩවා ඒ ලෙසම පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය කරන නිසා ම ස්වකීය සංවර්ධන රටාවන් ඔස්සේ කිරීමට සංවර්ධනය වන රටවලට නො හැකි ය. වෙනස් විය යුත්තේ එම රටාවන් සහ ශෛලීන් ය.

ඒ බැවින් රියෝ සමුළුවේද ප්‍රධාන ප්‍රශ්නයක් වශයෙන් සංවර්ධිත රටවල් විසින් ගෝලීය පරිසරය වෙනුවෙන් ඉටු කිරීමට භාර ගනු ලබන්නේ කුමක්ද යන්න ගැන සංවර්ධනය වන රටවල් පරීක්ෂාකාරී විය යුතු ය. තමන්ගේ ම පාරිසරික ගැටළු සහ ක්‍රියාමාර්ගී ද ඒවා සඳහා ඔවුන් දෙනැයි සිතන ආධාරද පිළිබඳ ව ඇති වැදගත්කමට වඩා මේ ප්‍රශ්නය සංවර්ධනය වන රටවලට වැදගත් කමින් අඩුවක් නැත. මෙය පරිසරයත් සංවර්ධනයත් අතර සම්බන්ධයේ තීරණාත්මක අංශයක් වන අතර ම සමුළුවේ සාර්ථකත්වය මැන බැලීමේ ප්‍රධාන මිණුම් දණ්ඩක් ද විය යුතු ය. පාරිසරික ප්‍රශ්න පිළිබඳ ව කෙරෙන ඇතැම් සාකච්ඡාවලදී විවිධ වර්ගයේ හානිකර විමෝචනයන් අඩු කිරීම සඳහා ඉලක්ක ඇති කරනු ලැබේ. සංවර්ධිත රටවල් විසින් පිළිගනු ලබන අඩු කිරීම් ප්‍රමාණය සංවර්ධනය වන රටවල අදාළ ප්‍රමාණයට වඩා වැඩි විය යුතු වීම ම මෙහිලා ප්‍රමාණවත් නො වේ. එක ශීර්ෂ ජීවන තත්ත්වයන් සහ පාරිභෝජන මට්ටම් පිළිබඳ අත්‍යන්ත සමතාවක් සඳහා පිවිසුම් මගක් ඇති කළ හැකි අන්දමේ ප්‍රතිමාන සකස් කර ගැනීමට, නිවැරදි කිරීමේ හෝ වළක්වා ලීමේ ක්‍රියා මාර්ගී පිළිබඳ වැඩ සටහන්වලින් ඉඩ සලසනු ලැබිය යුතු ය.

## 2. පාරිසරික වශයෙන් යහපත් සංවර්ධනයක් සඳහා මුළු සම්පත් පරතරය ගලපා ගැනීම

සංවර්ධනය වන රටවලට රියෝ සමුළුව ඉදිරියේ ඇති ඊළඟ උපායමාර්ගික අරමුණ වන ඒ මෙන් ම, පරිසරයත් සංවර්ධනයත් අතර සම්බන්ධතාවට මූලික වන කරුණ නම් පාරිසරික වශයෙන් හානිකර නො වන්නා වූ ද සිය වැඩි වන ජනගහනයේ අවශ්‍යතා සපුරා ලීමට තරම් වේගවත් වූ ද සංවර්ධන ක්‍රියාවලියක් සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ඔවුන්ට ලබා ගත හැකි ආධාරයයි. දුප්පත්කම සහිත වටපිටාවක හෝ වේවා වේගවත් ආර්ථික විපර්යාසයක් තුළ හෝ වේවා ජනගහන වර්ධනය, පරිසරයත් සංවර්ධනයත් පිළිබඳ ප්‍රධාන අංශයක් බවට සැකයක් නැත. එහෙත්, සියලු ඓතිහාසික අත්දැකීම්වලින් නියත ලෙස පෙනී යන පරිදි, ජනගහන වර්ධනයේ වේගය අඩු කර ලීම පිළිබඳ සාර්ථකත්වයත් සමාජමය සහ ආර්ථික සංවර්ධනයත් අතර පවත්නේ සමීප සම්බන්ධතාවකි. කෙසේ වෙතත්, ප්‍රමාණවත් සංවර්ධන රිත්මයක් ඇති කර ගැනීමෙහි ලා සංවර්ධනය වන රටවල සම්පත් පිළිබඳ දැඩි අවහිරතාවලට මුහුණ පාන්නට සිදු වන බව හොඳින් පිළිගැනුණු කරුණකි. ඔවුන්ගේ ආයෝජන අවශ්‍යතා හා ඉතිරි කිරීම් අතරත් ආනයන අවශ්‍යතා හා අපනයනයෙන් ලැබෙන ආදායම අතරත් සම්පත් පරතරයක් පවතී. වෙළඳාම සහ ආධාර පිළිබඳ ක්ෂේත්‍රයන් තුළ විවිධ ක්‍රියාමාර්ගී තුළින් ජාත්‍යන්තර ප්‍රජාව වෙතින් සංවර්ධනය වන රටවල් උදව්-උපකාර අපේක්ෂා කරන්නේ මෙකී පරතරය නැති කර ගැනීම සඳහා ය.

පරිසර ප්‍රශ්නය දැඩි අවධානයට ලක් විය යුතු විෂයයක් බවට පත් වීමට පෙර ද සංවර්ධනය වන රටවලට සම්පත් පරතරයට මුහුණ දෙන්නට සිදු වීම යථාර්ථයක් විය. සංවර්ධන ක්‍රියාවලිය තුළට පරිසර මානය හඳුන්වා දීම මෙකී පරතරය තවදුරටත් වැඩි වීමට හේතුවක් විය හැකි ය. ප්‍රතිව්‍යුහ, කර්මාන්ත යන ක්ෂේත්‍රයන්හි මෙන් ම කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ වුව ද පාරිසරික හානි නැති කරන හෝ අඩු කරන ආයෝජන සඳහා බොහෝ අවස්ථාවලදී කලින් ඒවාට වඩා අඩු මිලකින් නොව වැඩි මිලකින් යුත් තාක්ෂණ සහ උපකරණ අවශ්‍ය විය හැකි ය. භූමි සහ ඛනිජ සම්පත් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ පාරිසරික සහ භෞතික සීමාවන් කරා රටවල් ළඟා වන විට වඩා වියදම් සහිත ආංශීය වරණයන් සහ සංවර්ධන විකල්පයන් කරා පරිසර අනිවාර්යතා විසින් යොමු කරනු ලැබිය හැකි ය. ඒ බැවින්, පරිසරය හා සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නයේ මූලික ගැටළුව නම් සංවර්ධන රිත්මයට අනුව ප්‍රමාණවත් වන සහ ඒ අතරම පාරිසරික වශයෙන් හානිකර නො වන සංවර්ධන ක්‍රියාවලියක් සඳහා, සංවර්ධනය වන රටවලට වඩාත් විශාල ලෙස අවශ්‍ය වන මුළු සම්පත් අවශ්‍යතාවයි. මේ අනුව, දියුණු වන රටවල දෘෂ්ටි කෝණයෙන් බලන විට, රියෝ සමුළුවේ සාර්ථකත්වය මැනිය යුත්තේ ද පරිසරය හා සංවර්ධනය පිළිබඳ සම්බන්ධතාවේ විශාලත්වය

අනුව අපේක්ෂිත විශාලතර සම්පත් පරතරය විසඳීම සඳහා කෙතරම් දුරට ඉන් ප්‍රයෝජනයක් ලැබේද යන්න අනුවයි.

සම්පත් ලබා ගත හැකි වීම පිළිබඳ කරුණට අදාළ ව, සමුළුවට සූදානම් වීමේදී "අතිරේකත්වය" පිළිබඳ සංකල්පය දැනටමත් නිරූපිත ව ඇත. එහෙත්, නිශ්චිත ව්‍යාපෘති තුළට සහ කටයුතු තුළට පාරිසරික ආරක්ෂාව ඇතුළත් කිරීමේදී මතුවන අතිරේක වියදම් පිරිමසා ගැනීමට උදව් වීමේ ප්‍රශ්නය කෙරෙහි පමණක් අතිරේකත්වය අදාළ නො විය යුතු ය. සංවර්ධනය වන රටවලට ගලා එන මුළු සම්පත් ප්‍රමාණය ප්‍රමාණවත් නො වීමේ හේතුවෙන් සංවර්ධන ක්‍රියාවලිය සමස්තයක් වශයෙන් ව්‍යර්ථ නො වීම ද පරිසරයත් සංවර්ධනයත් අතර සම්බන්ධය සඳහා වෙනත් වචනවලින් කියතොත් "ප්‍රවර්තණීය සංවර්ධනය සඳහා" අවශ්‍ය වේ. දියුණු වන රටවලට තමන්ගේ වඩා පුළුල් සංවර්ධන අභිලාෂයන් මුදුන් පත් කැර ගැන්මට නො හැකි වෙතොත් සහ දුප්පත් කමත් පරිසර හායනයත් පුළුල් පෙරමුණක අඛණ්ඩ ව පවතී නම්, තෝරා ගත් අවස්ථාවන්හිදී කෙරෙන පාරිසරික මිණුම් වල අගය පැහැදිලි වශයෙන් ම අඩු වී යනු ඇත. එ බැවින්, අතිරේකත්වය පිළිබඳ සංකල්පය දෙස බලනු ලැබිය යුත්තේ නිශ්චිත කටයුතු වලට අදාළ වන ආකාරයට වඩා පුළුල් ලෙසකිනි. පාරිසරික වශයෙන් හානිකර නො වන සංවර්ධනයක් කරා යාමේ දී මතුවන විශාලතර මුළු සම්පත් පරතරය ගළපාලීමේ අවශ්‍යතාව හා එය අදාළ විය යුතු ය.

ගෝලීය රත්වීම සහ ජෛව විවිධත්වය නැතිවයාම අඩු කිරීම සඳහා දියුණු වන රටවල් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග බඳු නිශ්චිත කටයුතු සඳහා මුදල් යෙදවීමට අදාළ ප්‍රශ්නවලින් ඔබ්බට යාමටත් ප්‍රවර්තනීය සංවර්ධනය සඳහා ගලා එන මුළු සම්පත් ප්‍රමාණය කෙරෙහි බලපාන පුළුල් ගැටළු සමූහය වෙත අවධානය යොමු කිරීමටත් රියෝ සමුළුවට අවශ්‍යවන්නේ මේ නිසා ය. ප්‍රතිවිරුද්ධ වශයෙන් බලන කල, සංවර්ධනය වන රටවලට ගලා එන වර්තමාන මුළු මූල්‍ය සම්පත් ප්‍රමාණය සමස්ථයක් වශයෙන් ගැනීමේදී එය ප්‍රතිෂේධාත්මක වේ. එය සංවර්ධනය වන රටවලට ආපසු ගලාඒමක් වේ. ණය සේවා නිසා පමණක් පිටතට ගලායන මුදල් ප්‍රමාණය වර්ෂයකට ඩොලර් බිලියන 30 ක් පමණ වේ. වෙළඳාම පිළිබඳ තත්ත්වය පිරිහීම හේතු කොට ගෙන ඇති වන පාඩුව ද ඇතුළත් කරනු ලැබුව හොත්, මෙකී පාඩු මැනීම සඳහා තෝරාගනු ලබන පදනම් දිනය අනුව මෙකී ගණන ඩොලර් මිලියන 60 ත් බිලියන 200 ත් අතර ප්‍රමාණයක් වේ පාරිසරික වශයෙන් යහපත් වන සංවර්ධන ක්‍රියාවලියක් සඳහා වැඩිපුර මුළු සම්පත් පරතරයක් අවශ්‍ය කෙරෙන බැවින් වර්තමාන ආකාර්ය ගලනය නවතාලීම පමණක් නො ව එය විශාල ප්‍රමාණයෙන් යුත් සකාර්ය එකක් බවට පරිවර්තනය කිරීම ද අවශ්‍ය ය. සංවර්ධනය සඳහා ගලා එන සම්පත්වලට අදාළ මුළු ප්‍රශ්න මාලාව ම කෙරෙහි රියෝ සමුළුව අවධානය යොමු කළ යුත්තේ මේ නිසා ය.

විසඳ ගත යුතු මෙකී ප්‍රශ්න මාලාවට, සංවර්ධනය වන රටවල බාහිර ණය ගැටළුව ද, වෙළඳ ද්‍රව්‍යවල මිල අඩු වීම සහ වෙළඳ කොන්දේසි පිරිහී යාම පිළිබඳ ගැටළුව ද ආරක්ෂණවාදය සහ වෙළඳ පොළ පිවිසුම පිළිබඳ ප්‍රශ්නය ද, නිල සංවර්ධන ආධාර මගින් සැපයෙන සම්පත් ගලා ඒමේ ප්‍රමාණවත් භාවය, බහුපාර්ශ්වීය මූල්‍යායතන, පෞද්ගලික ප්‍රාග්ධන, වෙළඳ පොළ සහ විදේශීය ඍජු ආයෝජන පිළිබඳ ප්‍රශ්නය ද ඇතුළත් වේ. මෙකී ක්ෂේත්‍රයන් තුළ නිශ්චිත සහ විස්තරාත්මක ක්‍රියාමාර්ගී සාකච්ඡා කොට නියම කර ගැනීම සමුළුවේ විෂය පථයෙන් පරිබාහිර වේ. එහෙත් උපදේශකමාලා ලබා දීමටත් මෙකී ගැටළු විසඳීම සඳහා ඒවා ගැන කටයුතු කරන ස්ථානවලදී ශක්තිමත් අනුබලයක් ලබා දීමට සමුළුව අපොහොසත් වෙතොත් පරිසරය හා සංවර්ධනය පිළිබඳ විෂයෙහි ලා එයින් ප්‍රධාන මෙහෙයක් සිදු නො වනු ඇත. මෑත කාලය තුළදී මෙකී ප්‍රශ්න පිළිබඳ කරන ලද සාකච්ඡාවන්හිදී සහ සාමාන්‍යයෙන් උතුරු-දකුණු සංවාදයේදීත් අවහිරතා සිදු වී ඇත. පරිසරය හා සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නයෙහි ලා සියලු රටවල් පොදු උනන්දුව පිළිබිඹු කෙරෙන රියෝ සමුළුවට, හුදු සාමාන්‍ය අයුරින්, වඩා පුළුල් ප්‍රශ්න පිළිගැනීම, මගින් පමණක් නොව, නව ආරම්භයක් ඇති කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගේ එකමුතු අදිටන පිළිබිඹු කිරීම මගින් ද මෙකී දුෂ්කර ගැටළුව ජය ගැනීමේ අවස්ථාවක් උදා වී ඇත. මෙකී අභිප්‍රාය මුදුන් පමුණුවා ගැනීමේ දී ලබන සාර්ථකත්වය සමුළුවේ අගය තීරණය කැරෙන ප්‍රධාන කරුණක් බවට නිසැකයෙන් ම පත් විය යුතු ය.

## සමුළුවේ ප්‍රතිඵල ආකෘතිය

මේ සටහනෙන් උත්සාහ ගනු ලැබ ඇත්තේ රියෝ සමුළුව හමුවේ ඇති ප්‍රශ්නවලට අදාළ උපායමාර්ගික ප්‍රධාන කරුණු කීපයක් නිරූපණය කිරීමට පමණකි. තම ප්‍රධාන උපායමාර්ගික අභිප්‍රායන් සමුළුවේදී පෙරට ගෙනයනු ලබන බවට සහතික වනු වස් සංවර්ධනය වන රටවල් උත්සාහ දැරිය යුතුය. දැනටමත් එකඟ වී ඇති පුළුල් ආකෘතියක් ඇතුළත නිශ්චිත ප්‍රශ්න ගණනාවක් සම්බන්ධයෙන් ද සමුළුව ක්‍රියා කරනු ඇත.

මේ අයුරින් සමුළුවට කලින් වෙන වෙන කාර්යක්‍රම යටතේ දැනට සාකච්ඡා වෙමින් පවත්නා - බැඳුණු වගකීම් සහිත නෛතික ස්වභාවයෙන් යුත් ප්‍රඥප්ති දෙකක්, අත්සන් කරනු සඳහා සමුළුවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ. මේවා නම් දේශගුණික විපර්යාසය සහ ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රඥප්තියි. තව ද, පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ප්‍රශ්නය කරා ළඟාවීමේ මාර්ගය පිළිබඳ මූලික ප්‍රතිපත්තිය සහ ඉදිරි කාලය තුළදී මෙකී ප්‍රශ්නය පිළිබඳව ක්‍රියා කිරීමට අදාළ වැඩ සටහන පිළිබඳවත් ගිවිසුමක් ඇතිකර ගැනීමට සමුළුව විසින් ම අපේක්ෂා කෙරෙනු ඇත. ප්‍රතිපත්ති ප්‍රකාශය "මිහිතල ප්‍රකාශනය" නැතහොත් විකල්පයක් ලෙසින් "පරිසරය සහ සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය" යනුවෙන් හැඳින්වීමට නියමිත ප්‍රකාශනයකට ඇතුළත් කරනු ලබනවා ඇති අතර 21 වැනි සියවස පිළිබඳව කරුණු සලකා බැලීමට අපේක්ෂිත වැඩ සටහන "කාර්ය සටහන 21" යනුවෙන් නම් කෙරෙනු ඇත.

කෙසේ වෙතත්, මේ එක් එක් ලියවිල්ලක් සඳහා නිශ්චිත ප්‍රශ්න පිළිබඳ සවිස්තර සාකච්ඡා අවශ්‍ය වනු ඇති අතර මේ කාර්යය සඳහා සංවර්ධනය වන රටවල් උපරිම වශයෙන් සූදානම් විය යුතු ය. බාහිර වෙළඳ ශේෂයක් ද ඔවුන්ගෙන් ද ඉල්ලා සිටිණු ලබන සහනයක් ද ලැබෙන බවට ඔවුන් සහතික විය යුතු ය. එක් එක් ලියවිල්ලකින්ද සමස්තයක් වශයෙන් ගත් කල සමුළුවේ ප්‍රතිඵලවලින් ද මෙ බඳු ශේෂයක් පිළිබිඹු විය යුතු ය. නිදසුනක් ලෙසින්, ඔවුන්ට අතිශයින් වැදගත් වන කරුණු වලට ප්‍රතිලාභ වශයෙන්, හුදෙක් යහපත් අධ්‍යාශයන් පිළිබඳ ප්‍රකාශනයන් උදෙසා පමණක් පාරිසරික සංයමයන් සහ චරියාවන් පිළිබඳ බැඳීම් සහිත වගකීම් සංවර්ධනය වන රටවල් විසින් පිළිගනු ලැබීම සතුටු දායක නො වනු ඇත. තව ද, එක් එක් ලියවිල්ලේ විශේෂිත කරුණු යොදනු ලැබ ඇති ආකාරය ගැන සංවර්ධනය වන රටවල් සැහීමට පත් විය යුතු ය. නිදසුනක් ගනිතොත්, දේශගුණික විපර්යාසය පිළිබඳ ප්‍රඥප්තියෙහි, වගකීම් භාරගැනීම පිළිබඳ සාධාරණත්වයක්, සංවර්ධනයේ ශීඝ්‍රතාවට අනුව ස්ථාපනය වී තිබිය යුතු ය. ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රඥප්තියෙහි, ජෛව තාක්ෂණ පිවිසුමට සහ ගෙවීම් පිළිබඳ සාධාරණ නියමයන්ට සංරක්ෂණය හා නිදහස් පිවිසුම සම්බන්ධ කළ යුතු ය.

සමස්ත සම්පත් අවශ්‍යතා පිළිබඳ පෘථුලතර ප්‍රශ්නය කරා එළඹීම සම්බන්ධයෙන් වූ අර්ථවත් බැඳීම් හැරුණු විට, පරිසරය හා සම්බන්ධිත කටයුතුවලට මුදල් යෙදවීමට අදාළ ප්‍රශ්න රැසක් ඇත. විවිධ කටයුතු සඳහා වෙන වෙන ම ඇති අරමුදල් වෙනුවට හෝ ඊට අතිරේකව සමස්ත අරමුදලක් පිළිබඳ ප්‍රශ්නයත්, ලෝක බැංකුවේ ගෝලීය පරිසර අරමුදලේ අනාගතයත් පාලනයට සහ තීරණ ගැනීමට අදාළ ප්‍රජාතාන්ත්‍රික යන්ත්‍රණයත් පිළිබඳ ප්‍රශ්නයත්, තක්සේරු කරන ලද දායක මුදල් වලට ප්‍රතිවිරුද්ධ වශයෙන් ස්වේච්ඡා දායක මුදල් සහ පරිභෝජන බද්ද වැනි ස්වයංක්‍රිය ආදායම් මාර්ග පිළිබඳ විෂයයන්, යෝග්‍යතාව පිළිබඳ ප්‍රශ්නය සහ පාරිසරික අසම්භාව්‍යතාවේ ස්වභාවය සහ විෂයපථයත් මේවාට ඇතුළත් වේ. සංවර්ධනය වන රටවල් තාක්ෂණයට පිවිසීමත් එය පැවරීමත් එමෙන් ම පරිසරය හා සංවර්ධනය අතර සම්බන්ධතාව කෙරෙහි උරුගුවේ වටයේ බලපෑමත් සම්බන්ධයෙන් අදාළ වන ප්‍රධාන ප්‍රශ්න ද පැන නගී. මේ සියලු ප්‍රශ්න කෙරෙන්, රියෝ සමුළුවේ පුළුල් විෂයපථය ද ජාත්‍යන්තර පද්ධතියේ වෙනත් ප්‍රදේශ තුළ ක්‍රියා කරනු ලබන කරුණු රැසකට එහි ඇති සම්බන්ධය ද අවධාරණය කෙරේ. අවසාන වශයෙන්, ප්‍රඥප්තියේ නැතහොත් ප්‍රකාශණයේ සහ "කාර්ය සටහන 21" හි නිරූපණය වන නියමයන් අතිශයින් වැදගත් වනුයේ මේ නිසා ය. පරිසරයත් සංවර්ධනයත් අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳ නිසියාකාර ව ක්‍රියා කිරීම මගින් ගෝලීය පාරිසරික ගැටළුව විසඳීමෙහි ලා සමුළුවෙන් ඉටු වන මෙහෙයේ ස්වභාවය සහ ප්‍රමාණය, යෝජිත ප්‍රඥප්තීන් ද ඇතුළු ඉහත කී කරුණුවලින් නිගමනය කෙරෙනු ඇත.